# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2176/20 - 2020 මැයි මස 22 වැනි සිකුරාදා - 2020.05.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

5 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 5 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, 2020 මාර්තු මස 03 දිනැති අංක 2165/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උපලේඛනය මගින් දක්වා ඇති සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 03.03 යටතේ වන සහ ධීවර අමාත්‍යාංශයේ ලියාපදිංචි දේශීය ටින් මාළු නිෂ්පාදන කර්මාන්තකරුවන් එම අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව ආනයනය කරනු ලබන ජැක් සහ හෝස් මැකරල් (Jack and horse mackerel - Trachurus spp./ රේගු සංකේතාංක 0303.55) මසුන්, සඳහා අදළ වන 10% හෝ කිලෝග්‍රෑමයකට රු. 150ක් වන විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් කිලෝග්‍රෑමයකට රු. 6ක් අයකරගෙන ඉතිරි ප්‍රමාණය අත්හරිනු ලැබිය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

මෙම නියමය 2020 මැයි මස 22 වැනි දින සිට ආරම්භ වන මාස 03 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, වලංගුව පැවතිය යුතුය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 මැයි මස 21 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

06 - 195

1A - PG 5000 — 567 (2020/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*